ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

ඉඩම් මහලේකම් කාර්යාලය,
නො: 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல: 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
No: 1200/6, Rajamalwatta Road, Battaramulla.

ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2864051
ඊමේල් / ஈ-மெயில் / E-mail - info@landcommdept.gov.lk

මගේ අංකය / எனது இல / MY NO - 5/1/ශාප්‍ර/පොදු/ප්‍රතිපත්ති තීරණ

ඔබේ අංකය / உமது இல / YOUR NO -

දිනය / திகதி / DATE - 2015.08. 28

චක්‍ර ලේඛ අංක - 2015/05

09 SEP 2015

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්

සියළුම නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්),

**ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉඩමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන ආදායම් සීමාව සංශෝධනය කිරීම**

1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකාවේ පුරවැසියකුට නියාදන සාධන පත්‍රයක් මත ඉඩමක් පවරාදීමේදී ශක්‍ය පැවරුම්ලාභීන්ගේ පවුලේ ආදායම් මට්ටම සැලකිල්ලට ගත යුතුවේ. ඒ අනුව මගේ නියෝග අංක 273 හා ඊට අදාළ සංශෝධිත චක්‍රලේඛ මගින් දැනට නියම කර ඇති පවුලේ උපරිම ආදායම් සීමාව වර්තමාන තත්ත්වයට ගැලපෙනසේ සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය මතු වී ඇත.

ඒ අනුව මෙම චක්‍රලේඛයේ දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම පනත යටතේ ප්‍රදානපත්‍රයක් ලැබීම සඳහා සුදුසුකම් ලැබීමට පැවරුම්ලාභියාගේ පවුලේ ආදායම් මට්ටම මසකට රු. 12,000 කට නොවැඩි විය යුතු බව සලකන්න.

තවද මෙවැනි ඉඩමක් පවරාගනු ලැබූ ප්‍රදානපත්‍ර ලාභියකු විසින් එය මෙම පනතේ විධිවිධාන අනුව තෙවන පාර්ශවයකට නියාදනය කිරීමේ දී (පැවරීමේදී) ද, පැවරුම්ලාභියාගේ පවුලේ මාසික ආදායම රු. 12,000 නොඉක්මවන බවට වගබලා ගත යුතුය. මගේ නියෝග අංක 276 ද මේ අනුව සංශෝධනයවූ සේ සලකන්න.

මෙම චක්‍රලේඛය ලද බව කාරුණාකර දන්වන්න.

ආර්. පී. ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -
1. ජනාධිපති ලේකම් - කා.දැ.ගැ.ස.
2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
3. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ.ගැ.ස.